# ව්‍යාපාර අධ්‍යයනය - 5 - ව්‍යවසායකත්වය

1.ව්‍යවසායකත්වයේ ප්‍රධානතම කාර්යභාරයක් වනුයේ,

1.භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනය කිරීමයි.
2.යෙදවුම් නිමවුම් බවට පත්කිරීමයි.
3.අවදානම්වලට නිතර මුහුණ දීමයි.
4.ව්‍යාපාර පරිසර අධ්‍යයනය කිරීමයි.
5.නවෝත්පාදනයයි.

2.පහත ඒවා අතුරෙන් ව්‍යවසායකත්වයේ ප්‍රවණතතාවක් නොවන්නේ,

1.කාන්තා ව්‍යවසායකත්වය
2.ආයතනික ව්‍යවසායකත්වය
3.ගෝලීය ව්‍යවසායකත්වය
4.හරිත ව්‍යවසායකත්වය
5.අභ්‍යන්තර ව්‍යවසායකත්වය

3.රටකට ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් අත්වන ප්‍රතිලාභයක් නොවන්නේ,

1.නව රැකියා උත්පාදනය
2.ජාතික නිෂ්පාදිතයේ වර්ධනය
3.භාණ්ඩ සඳහා වන ඉල්ලුම අවම වීම.
4.ක්‍රය ශක්තිය ඉහළ යාම.
5.ප්‍රාදේශීය සම්පත් භාවිතය වැඩිවීම.

4.ව්‍යවසායකත්වය තුළින් ව්‍යාපාර ආයතනයකට අත්වන ප්‍රතිලාභයක් නොවන්නේ,

1.අයිතිකරුවන්ගේ ආත්ම තෘප්තිය ඉහළ යාම.
2.තරඟකාරීත්වයට හොඳින් මුහුණ දීමට හැකිවීම.
3.වෙළෙඳපොල කොටස වැඩි කරගත හැකි වීම.
4.අඛණ්ඩ ව්‍යාපාර වර්ධනයක් අත්කරගත හැකිවීම.
5.තම කර්මාන්තය තුළ විශිෂ්ටත්වයට පත්විය හැකිවීම.

5.ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා කුසලතා සංවර්ධනයට අදාළ සාධක සහ ඊට එරෙහිවන සාධක කිහිපයක් පහත දැක්වේ.

A - ස්වයං ඇගයීම　　　B - අත්දැකීම්
C - උදාසීන බව　　　D - සාම්ප්‍රදායික චින්තන රටාව
E - අධ්‍යාපනය　　　F - අනුකරණය

ඉහත දෑ අතුරෙන් ව්‍යවසායකත්ව සංවර්ධනයට එරෙහිවන සාධක පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

1.A,B හා C

2. C,D හා F
3. A,E හා F
4. A,B හා E
5. A,D හා E

6.පහත දක්වා ඇති කුසලතා අතුරෙන් ව්‍යවසායකත්ව කුසලතාවයක් නොවන්නේ,

1.කලාත්මක කුසලතා
2.නායකත්ව කුසලතා
3.අන්තර් පුද්ගල කුසලතා
4.සන්නිවේදන කුසලතා
5.මූලික කළමනාකරණ කුසලතා

7.ව්‍යවසායකයා යන්න නිර්වචනය කර ඇති පහත ප්‍රකාශ අතුරෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1.කිසියම් ප්‍රතිලාභයක් බලාපොරොත්තුවෙන් වෙනස් කිරීම් කරනු ලබන පුද්ගලයා ව්‍යවසායකයා ලෙස හැඳින්වේ.
2.භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා භූමිය,ශ්‍රමය,ප්‍රාග්ධනය යන සාධක සංකලනය කරන පුද්ගලයා ව්‍යවසායකයා ලෙස හැඳින්වේ.
3.වේගයෙන් වෙනස්වන ලෝකයේ සංකීර්ණ මිනිස් වුවමනා සපුරාලීම සඳහා එම වෙනස්කම්වලට නිර්මාණශීලීව ප්‍රතිචාර දක්වන පුද්ගලයා ව්‍යවසායකයා ලෙස හැඳින්වේ.
4.පවතින අදහසක් හෝ සංකල්පයක් තමා විසින් අත්පත් කර ගනිමින් හා ව්‍යාපාර පරිසරය හොඳින් විශ්ලේෂණය කරමින් නව තීරණ ගැනීමේ නිරත පුද්ගලයා ව්‍යවසායකයා ලෙස හැඳින්වේ.
5.පරිසර අවස්ථා නිර්මාණශීලීව උකහා ගෙන අවදානමක් දරමින් නවෝත්පාදන බිහිකිරීමේ නිරතවන පුද්ගලයා ව්‍යවසායකයා ලෙස හැඳින්වේ.

8.පහත දෑ අතුරෙන් අභ්‍යන්තර ව්‍යවසායකත්ව ලක්ෂණය කුමක්ද?

1.ආයතනයේ නව තනතුරු බිහිකර ඒවාට නව සේවකයන් බඳවා ගැනීම හා ඔවුන් නිර්මාණශීලී ලෙස ආකර්ෂණය කර ගැනීම.
2.පාරිසරික හා සමාජීය ගැටළු විසඳීම සඳහා විසඳුම්,ප්‍රජාවගෙන් ලබා ගැනීම.
3.සංවිධානවල විවිධ තනතුරුවල සිටින පුද්ගලයින් තම නිර්මාණශීලීත්වය භාවිත කරමින් නිෂ්පාදිත හා නිෂ්පාදන ක්‍රමවල වෙනස්කම් සිදු කිරීම.
4.රටක ජීවත්වන මිනිසුන්ගේ ආර්ථික ගැටළු සඳහා නිර්මාණශීලීව පිළියම් සෙවීමයි.
5.ලොව පුරා සිටින පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා හා වුවමනා හඳුනාගෙන එම අවශ්‍යතා හා වුවමනා සපුරාලීමට නිෂ්පාදිත බිහිකිරීම.

9.පුද්ගලයෙකු සතු ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A - මනා අවබෝධය
B - වැඩට කැපවීම
C - සම්ප්‍රදායට ගරු කිරීම.
D - අවදානම වෙනත් පාර්ශවයන්ට විතැන් කිරීම.
E - නම්‍යශීලී බව

ඉහත දෑ අතුරෙන් ව්‍යවසායකයෙකු සතු ලක්ෂණ පමණක් ඇතුළත් වරණය කුමක්ද?

1.A ,B හා C
2. A , C හා D
3. B ,C හා E
4.B ,D හා E
5. A ,B හා E

10.පහත දක්වා ඇත්තේ ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ පියවර කිහිපයකි.

A - ව්‍යාපාර සැලැස්ම සැකසීම.
B - යථාර්ථයක් බවට පත් කිරීම.
C - නව්‍යතා සොයා ගැනීම.
D - ප්‍රතිලාභ ලැබීම.
E - අවශ්‍ය සම්පත් සපයා ගැනීම.

ඉහත පියවරයන් නිවැරදිව පෙළ ගස්වා ඇති පිළිතුර වන්නේ,

1.A ,C ,E ,D ,B
2.A ,C ,E ,B ,D
3.A ,C ,D ,E ,B
4.C ,A ,D ,B ,E
5.C ,A ,E ,B ,D

## <u>පිළිතුරු</u>

| | |
|---|---|
| 1.) 5 | 6.)1 |
| 2.) 2 | 7.) 4 |
| 3.) 3 | 8.) 3 |
| 4.) 1 | 9.) 5 |
| 5.) 2 | 10.) 5 |

## <u>සැකසීම -</u>

කේ.එම්.ඩී.ඩී.කුරුප්පු මිය,
ර/ඇහැලියගොඩ ම.ම.වි.